දිවි තොර කර ගැනීම් වාර්තා කිරීම සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශයන් තුළ, දිවි තොර කර ගත් ආකාරයන් සඳහන් නොකරන ලෙසත්, දිවි තොර කර ගැනීමට හේතු සරල කොට නොදක්වන ලෙසත් මාධ්‍යවේදීන්ට පෙන්වා දෙයි. එසේම දිවි තොර කර ගැනීම් සම්බන්ධ වාර්තා හා හදිසි උපකාරක අංක සඳහන් කරන ලෙසින්ද උපදෙස් දෙයි.

මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින්, දිවි තොර කර ගැනීම් වාර්තා කිරීමේදී මෙම කරුණු පිළිපදින ලෙසට මාධ්‍යවේදීන්ව දිරිමත් කරන්නේ, දිවි තොර කර ගැනීමේ නැඹුරුතාවයක් ඇති අයෙකු දිවි තොර කර ගැනීමක් අනුකරණය කිරීමට ඇති ඉඩකඩ අවම කිරීම සඳහායි.

සබරගමුව සරසවියේ ඉගෙනුම ලැබූ යාපනයේ තරුණියක් දිවි තොර කර ගැනීමෙන් මිය යැමේ සිදුවීම ජූලි 31, 2023 දින සිංහල හා දමිළ භාෂා පුවත්පත් තුළ වාර්තා වී ඇති ආකාරය, මෙම පසුබිම තුළ සලකා බැලිය හැක. ඔබ සිතන ලෙසට, මෙම පුවත එදින වාර්තා කර තිබූ දිනමිණ, දිවයින, සහ තමිලන් පුවත් වාර්තාවන්, මෙම දිවි තොර කර ගැනීමේ සිදුවීම, මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූලව වාර්තා කිරීමට වගකීම් සහගත වී තිබේද?

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක: *CCCline - 1333 *ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308 *ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර: https://apps.who.int/.../258814/WHO-MSD-MER-17.5-eng.pdf

https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf

https://accountablejournalism.org/.../australia-standards...

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!